www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 7 – Second Term Test – July 2019
දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 7 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

## Eastern Music
පෙරදිග සංගීතය

Name :- .................................................... Grade : -................ Index number:-....................

➢ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

01. මන්ද්‍ර සප්තකයේ ස්වර හැඳින්වීම සඳහා,

(i) ස්වරයට උඩින් තිතක් තබයි. (ii) ස්වරයට යටින් තිතක් තබයි.

(iii) ස්වරයට උඩින් ඇලයට ඉරක් අඳිනු ලැබේ. (iv) ස්වරයට යටින් ඉරක් අඳියි.

02. සප්තකයෙහි කෝමල ස්වර ............................. ඇත.

(i) 01 යි. (ii) 02 යි.

(iii) 03 යි. (iv) 04යි.

03. සරිග, සරිගම/............. යන ස්වර රටාවේ ඊළඟ පියවර,

(i) ගමප, ගමපධ (ii) රිගම, රිගමප

(iii) සගම, සරිගම (iv) රිමග, රිගමප

04. ධ්‍රැත ලය යනු,

(i) ඉතාම අඩු වේගය වේ. (ii) සාමාන්‍ය වේගය වේ.

(iii) ඉතා වැඩි වේගය වේ. (iv) සාමාන්‍යයෙන් අඩු වේගය වේ.

05. සුළු මැදුම් දෙතිතට තාල විභාග වනුයේ,

(i) 3/4 වශයෙනි. (ii) 4/3 වශයෙනි.

(iii) 3/2 වශයෙනි. (iv) 2/3 වශයෙනි.

06. "අඹ දඹ නාරං කෙසෙල් දෙල්..............." යන නූර්ති ගීතය,

(i) රාමායනය නූර්තියේ ය. (ii) දුටුගැමුණු නූර්තියේ ය.

(iii) පද්මාවතී නූර්තියේ ය. (iv) ශ්‍රී වික්‍රම නූර්තියේ ය.

07. "පින් මද පුතුන් සියයක් ලදුවත් නිසරු..........." මෙම ගී පදයේ ලඝු මාත්‍රා ගණන වන්නේ,

(i) 06 කි. (ii) 04 කි.

(iii) 08 කි. (iv) 10 කි.

08. කාරුණාව සමග හොඳහිත පතුරන්න........ යන ගීතය,

(i) නාට්‍ය ගීතයකි. (ii) උපදේශාත්මක ගීතයකි.

(iii) ළමා ගීතයකි. (iv) නූර්ති ගීතයකි.

Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

09. සප්තකයක ඇති මුළු ස්වර ගණන වනුයේ,

(i) 06 කි. (ii) 08 කි.

(iii) 12 කි. (iv) 10 කි.

10. සුශිර වාද්‍ය භාණ්ඩ ඝනයට අදාල භාණ්ඩයකි,

(i) වයලීනය. (ii) මැන්ඩලීනය.

(iii) ගිටාරය. (iv) රෙකෝඩර්

11. වැලපුම් ගීතයක් ගායනා කිරීම සඳහා උචිත වන ලය වන්යේ,

(i) මධ්‍යලය. (ii) විලම්භලය.

(iii) ධ්‍රැතලය (iv) සාමාන්‍යලය.

12. + සසු ර / වසන / තු රූ s / s s s/ ඉහත ගීත ප්‍රස්තාරය,

(i) සමග්‍රහයෙන් ගැයේ. (ii) ග්‍රහයෙන් ගැයේ.

(iii) අවග්‍රහයෙන් ගැයේ. (iv) විෂම ග්‍රහයෙන් ගැයේ.

13. දරු නැලවිලි ගී ඇසුරින් සකස් වූ සරල ගීතයකි,

(i) අම්මා සඳකි.......... (ii) ආදරයේ උල්පත වූ..........

(iii) මට මැණි වගේ.......... (iv) මිහි මඩලේ අඳුරු කුසේ..........

14. රබන් ගී ප්‍රසිද්ධව පවතින පලාතකි,

(i) මහනුවර (ii) කුරුණෑගල

(iii) නාකුළුගමුව (iv) අනුරාධපුරය

15. "ගම්භීර කාලිංග නුවර නිරිඳුගේ වාසල තුළයට....." මෙම ගීතය,

(i) කෝලම් ගීතයකි. (ii) නූර්ති ගීතයකි.

(iii) සරල ගීතයකි (iv) නාඩගම් ගීතයකි.

➢ පහත සඳහන් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු ලියන්න.

16. නූර්ති නාට්‍ය සඳහා යොදාගනු ලබන්නේ .................................................. සංගීත ශෛලිය වේ.

17. "සාර සදිසි පෙති - පේර නෙළන කල....." යන ගීතය .................................................. ගණයට අයත් වේ.

18. .......................................................... නම් භාණ්ඩය ස්වර පුවරු භාණ්ඩ ලෙස නම් කරනු ලැබේ.

19. ශුද්ධ ස්වරයට වඩා හඬ භාගයක් වැඩි වනුයේ ............................................................ ස්වරයේ ය.

20. දේශානුරාගය ඇතිවන අයුරින් පද රචනා කර ඇත්තේ .......................................................... ගීතවලය.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk
සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

## II කොටස

➢ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. (i) ලය යනු කුමක්දැයි හඳුන්වන්න. *(ලකුණු 03 යි)*

(ii) ලයෙහි ප්‍රභේද නම් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) එක් එක් ලය සඳහා උදාහරණ වශයෙන් එක් ගීතය බැගින් සඳහන් කරන්න. *(ලකුණු 06 යි)*

02. (i) ඔබ උගත් කෝමල ස්වර ස්ථාපන ගීතයක් ලියන්න. *(ලකුණු 06 යි)*

(ii) එම ගීතය අසුරින් ස්වර අභ්‍යාසයක් උච්ච ෂඩ්ජය දක්වා ගොඩ නගන්න. *(ලකුණු 03 යි)*

(iii) එම ස්වර අභ්‍යාසයේ අවරෝහණ ආකාරයද ලියා දක්වන්න. *(ලකුණු 03 යි)*

03. (i) ස්වර පුවරුවක් ඇඳ පහත සඳහන් ස්වර එහි ලකුණු කරන්න.

❖ කෝමල ස්වර *(ලකුණු 02 යි)*
❖ තීව්‍ර ස්වර *(ලකුණු $\frac{1}{2}$ යි)*
❖ ශුද්ධ ස්වර *(ලකුණු $\frac{1}{2} \times 7 = 3\frac{1}{2}$ යි)*

(ii) අචල ස්වර සහ චල ස්වර යනු මොනවාදැයි එකිනෙක හඳුන්වන්න. *(ලකුණු $2 \times 2 = 4$ යි)*

(iii) විකෘති ස්වර යනු කුමක්දැයි විස්තර කරන්න. *(ලකුණු 02 යි)*

04. (i) තිත යනු කුමක්දැයි විස්තර කරන්න. *(ලකුණු 03 යි)*

(ii) තිතෙහි ප්‍රභේද ලියන්න. *(ලකුණු 03 යි)*

(iii) එක් එක් තිතට ගැලපෙන ගී පාදය බැගින් ලියන්න. *(ලකුණු $2 \times 3 = 6$ යි)*

05. (i) සමග්‍රහය, විෂමග්‍රහය, අවග්‍රහය යන පාරිභාෂිත පද එකිනෙක විස්තර කරන්න.

*(ලකුණු $2 \times 6 = 06$)*

(ii) ඉහත සඳහන් ග්‍රහයන් තුනට වෙන් වෙන් වශයෙන් උදාහරණ සපයන්න.

*(ලකුණු $2 \times 3 = 6$ යි)*

06. (i) කෝලම් ගී පිළිබඳ ඔබ දන්නා කරුණු 03ක් ලියන්න. (ලකුණු 03 යි)

(ii) කෝලම් චරිත 03ක් නම් කරන්න. *(ලකුණු 03 යි)*

(iii) ඔබ දන්නා කෝලම් ගීතයක කොටසක් ලියන්න. *(ලකුණු 06 යි.)*

07. (i) දරු නැලවිලි ගී සහ රබන් ගී පිළිබඳ වෙන් වෙන් වශයෙන් කෙටි විස්තරයක් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) ඔබ උගත් දරු නැලවිලි ගීතයක් සහ රබන් ගීතයක් ලියා දක්වන්න.

*(ලකුණු $4 \times 2 = 08$ යි)*

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!


agaram.lk